# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# COVID -19 සති පාසල් වැඩ සටහන

## පෙරදිග සංගීතය

## 12 ශ්‍රේණිය දෙවන වාරය

## කාලය 2020 - 05 -04 සිට 2020 - 05 -08

---

දිනය - 2020 - 05 -06 කාර්ය පත්‍රිකා අංක 01

නිපුණතාව - 1.0 නිපුණතා මට්ටම - 1.3

පාඩම - තාන හා විවිධ තාන වර්ග

- අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

01. ධනි සග මධ නිස නිධ මග මග රිස යන තානාලංකාරය බාගේශ්‍රී රාගයට අයත්,

(1) ශුද්ධ තානයකි (2) කූට තානයකි (3) බෝල් තානයකි

(4) ගමක් තානයකි (5) ෆිරට් තානයකි (............)

02. ස්වර අභ්‍යාස හෝ පල්ටා රටාවකට අනුව ගොඩනැගෙන තානාලංකාර හඳුන්වනුයේ කුමන නමකින් ද?

(1) බෝල් තාන (2) සපාට් තාන (3) අලංකාරික තාන

(4) මිශ්‍ර තාන (5) ශුද්ධ තාන (............)

03. වීණා, සිතාර් , සරෝද් වැනි භාණ්ඩවලින් වයන තානාලංකාර හඳුන්වන විශේෂ නාමය වන්නේ,

(1) සූත් (2) තෝඩා (3) ජලා

(4) උපජ් (5) ඣෝඩ් (............)

04. ඛ්‍යාල් ගීතයේ වචන ඇසුරු කරමින් ගයන තානාලංකාර වර්ගය කුමක් ද?

(1) කූට තාන (2) බෝල් තාන (3) ශුද්ධ තාන

(4) අලංකාරික තාන (5) මිශ්‍ර තාන (............)

05. පහත දැක්වෙන තානාලංකාර අතරින් ගමක් තානයක් දැක්වෙන වරණය තෝරන්න.

(1) පනි සරි නිධ පධ / මග රිග නි-ස-

(2) ධනි ස,නි සග සග / ම,ග මධ මධ නිස

(3) ගම ම,ග මම ගම / මම ගම ගරි ස-

(4) රිම පධ මප ස- / පධ මග රිග ස-

(5) සනි ධප මග රිග / ස- රිම පනි ස- (............)

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**COVID -19 සති පාසල් වැඩ සටහන**

**පෙරදිග සංගීතය**

**12 ශ්‍රේණිය දෙවන වාරය**

**කාලය 2020 - 05 -04 සිට 2020 - 05 -08**

---

දිනය - 2020 - 05 -06 කාර්ය පත්‍රිකා අංක 02

නිපුණතාව - 1.0 නිපුණතා මට්ටම - 1.3

පාඩම - තාන හා විවිධ තාන වර්ග

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. තානාලංකාර සඳහා කෙටි නිර්වචනයක් සකස් කරන්න.

02. කූට තාන සහ මිශ්‍ර තාන පිළිබඳ ව නිර්දේශිත රාගයක උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

03. මධ්‍යලය ගීතයක හා විලම්භලය ගීතයක තානාලංකාර ගායන / වාදනයේ ඇති සුවිශේෂතා පැහැදිලි කරන්න.

04. තානාලංකාර ගායනයෙන් / වාදනයෙන් ගායකයාගේ හෝ වාදකයාගේ ශිල්පීයත්වය , නිර්මාණශීලීත්වය පෙන්නුම් කරන අයුරු පැහැදිලි කරන්න.